ජනශක්ති බැංකු සංගම්

# දුප්පත් අම්මලාගේ පොහොසත් උත්සාහයන්.



ජනසවිය උත්සාහයන්

අංක – 4

# ජන ශක්ති කාන්තා කියමන්

දුප්පත්කමේ සෝ කඳුලැලි පියලන්න
ජන ශක්ති බැංකුවෙන් හැකි බව දැනගන්න

★

ඉරපායා ඉර මුදුනට එන්න එපා
සඳපායා සඳ මුදුනට එන්න එපා
ණයක් වොතොත් ගිණි පොලියට ගන්න එපා
දුප්පත් කමින් සැමදා මිරිකෙන්න එපා

★

පොඩ්ඩෙන් පොඩ්ඩ ඉතිරි කර
දුප්පත්කමේ සයුරෙන් එතෙරට යන
ජන ශක්ති බැංකු පතුර තදමු.

★

(පසු පිටේ කවරයේ විමලරත්න කුමාරගමගේ කවිය විවාසිතය
(1946) කවියෙති)

BKT 0154
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ජන ශක්ති බැංකු සංගම්

## දුප්පත් අම්මලාගේ පොහොසත් උත්සාහයක්

ඩබ්. ජී. මිත්‍රරත්න
දිසාපති
හම්බන්තොට

ප්‍රකාශනය:
ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව
1991 ජුනි

පටුන පිටුව


1. පංචවිධ මූලධර්ම 1

2. දුප්පත් අම්මලා සංවිධානය වෙයි. 6

3. ජනශක්ති බැංකු සංගම් ව්‍යවස්ථාව 13



මුද්‍රණය

තරුණ සේවා මුද්‍රණාලය – මහරගම.

# පංචවිධ මූලධර්ම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනසවිය ක්‍රියාත්මක වන හම්බන්තොට හා සූරියවැව උප දිසාපති කොට්ඨාශවල ජනශක්ති බැංකු සංගම් 20 ක් දැනට පිහිටුවා ඇත. මෙම බැංකු සංගම්වල දුප්පත් අම්මලා 6050 දෙනෙකු සාමාජිකත්වය ලබා ගෙන ඇත. කුඩා ගම්මාන 124 ක පිහිටුවා ඇති ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති මෙම බැංකු සංගම් 20 තුළ ගොනුවී ඇත. මෙම ජනශක්ති බැංකු සංගම් වැඩසටහනට පාදක වී ඇති පංචවිධ මූලධර්මය පැහැදිලි කිරීමට මෙහිදී බලාපොරොත්තු වෙමි.

## දුප්පත් පවුල්වලට කැපවීම

ජනශක්ති බැංකු සංගම් වැඩසටහන දුප්පත් පවුල්වලට පමණක් කැපවීම පළමුවන මූලධර්මය වේ.

මේ යටතේ ජනසවිලාභී පවුල්, ආහාර මුද්දරලාභී පවුල්, මහජනාධාර ලබන පවුල් හා වෙනත් දුප්පත් පවුල්වලටත් සාමාජිකත්වය සීමාවේ. දුප්පත් පවුල් හඳුනා ගැනීම ග්‍රාමීය කාන්තා සමිතිය මගින් කළ යුතුව ඇත.

ලංකාවේ තිබෙන අතිකුත් සියළුම මූල්‍ය සංවිධානවලින් වෙනස්වන ප්‍රධාන ලක්ෂණය වන්නේ මෙය දුප්පත් පවුල්වලට පමණක් කැපවීමයි. සියළුම රාජ්‍ය බැංකු, ස.ණ.ස. සමිති ආදියේ ඇත්තේ ගණුදෙනුකරුවන්ට හා සමාජිකත්වයට විවෘත භාවයකි. මෙහි ප්‍රතිඵලය ලෙස දක්නට ඇත්තේ මෙම සංවිධානවලින් වඩාත් සේවයක් ලබා ගැනීමට ඇති හැකි පවුල්වලට පුළුවන් වීමයි. විවෘතභාවය තුළ මෙය වැළැක්විය නොහැකිය. මෙය හරියට දිවීමේ තරඟයකට ධාවනයෙහි දක්ෂයින් සමඟ දුර්වලයින් පිරිසක් එකට තබන්නාක් වැනිය. එවිට දුර්වලයින් පස්සට තල්ලු වීම ඉබේම සිදුවේ. එහෙයින් දුප්පත් පවුල්වට පමණක් සීමා කිරීම ඔවුන් නඟා සිටුවීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙහිදී බංග්ලා දේශයේ අක්කර 1/2 කට අඩු ඉඩම් අයිතිය ඇති පවුල් එහි 'ග්‍රාමීය බැංකු' ක්‍රමයකට ඇදා ගැනීමේ අදර්ශය සැළකිල්ලට ගැනීම

ප්‍රයෝජනවත් වේ. මෙම මූලධර්මයේ වැදගත්කම, ජනශක්ති බැංකු සංගම් 20 ණයදීම් ආරම්භ කර මාස 04 ක කාලයක අත්දැකීම්වලින් සනාථ වී ඇත.

හම්බන්තොට හා සූරියවැව ප්‍රාදේශීය කොට්ඨාශවල ජනසවිය යටතේ පසුගිය මාස 20 තුළ රාජ්‍ය බැංකු 03 කින් ණය දී ඇති පවුල් සංඛ්‍යාව සමඟ ජනශක්ති බැංකු සංගම් ණය දී ඇති පවුල් සංඛ්‍යාව සැසඳීමෙන් මනාව පැහැදිලි වේ (මේ දත්ත 91 මැයි දක්වාය.)

| | |
|---|---|
| ලංකා බැංකුව | -644 |
| මහජන බැංකුව | -415 |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව | -268 |
| ජනශක්ති බැංකු සංගම් | -1066 |

රාජ්‍ය බැංකු තුන ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවකට ළදරු ජනශක්ති බැංකු සංගම් වැඩසටහන මගින් ණය නිකුත් කිරීමෙන් දුප්පතුන් වෙත කැප වන ආයතනයක අවශ්‍යතාවය පැහැදිලි වේ.

## කාන්තා සහභාගිත්වය

**ජනශක්ති බැංකු සංගම්වල දෙවැනි මූලධර්මය වී ඇත්තේ කාන්තා සහභාගිත්වයයි.**

ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති සඳහා භූගෝලීය ඒකකය වී ඇත්තේ කුඩා ගම්මානයයි. එය සහභාගිත්වයට පහසුවක් වී ඇත. එමෙන්ම ජනශක්ති බැංකු සංගමය ආර්ථික ශක්තිය රැක ගැනීමට කුඩා ගම්මාන 5 - 8 අතර ප්‍රමාණයකට සීමාකර ඇත. මේ නිසා මහ සභා රැස්වීම්වලට සියළුම සාමාජිකාවන්ට සහභාගි විය හැකිය. ඉහත කී බැංකු සංගම් 20 හි මහා සභා රැස්වීම් 40 පසුගිය කාලයේ පවත්වා ඇත. ඒවාට කාන්තා සහභාගිත්වය අතින් හොඳ දයකත්වයක් තිබුණි.

කාන්තා සහභාගිත්වය යටතේ වඩාත් වැදගත් තැනක් ගන්නේ තීරණ ගැනීමේදී දක්වන සහභාගිත්වයයි. ජනශක්ති බැංකු සංගම්වල ණය දීම පිළිබඳ තීරණ මුලින්ම ගන්නේ 5 දෙනාගේ කණ්ඩායම් මගින්ය. ඊට පසු ග්‍රාමීය කාන්තා

සංවර්ධන සමිති මගින් නිර්දේශ කළ පසුව ජන ශක්ති බැංකු සංගමයේ පාලක මණ්ඩලය මගින් අනුමත කළ යුතුයි. පාලක මණ්ඩලය යනු අදාල බලප්‍රදේශයේ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල සභාපතිනියන්ගෙන් සමන්විත වූ මණ්ඩලයකි. මේ නිසා තීරණ ගැනීම සම්පූර්ණයෙන්ම කාන්තා සහභාගිත්වය යටතේ සිදුවේ පසුගිය මාස 04 තුළ රු 14,48,000/- ක මුදලක් පවුල් 1066 කට දීමට තීරණය කර ඇත්තේ මේ කාන්තා සහභාගිත්වය ඇතිවයි.

කාන්තා සහභාගිත්වය යටතේ ඊළඟ වැදගත් කරුණ වන්නේ ප්‍රතිලාභ ලැබීමේදී ඔවුන්ගේ සහභාගිත්වය කොතෙක්ද යන්නයි. පසුගිය කාලයේ බොහෝ දිස්ත්‍රික්කවල විමධ්‍යගත අයවැය යටතේ විශාල මුදලක් වැය කරනු ලැබුවේ විදුලිය සැපයීමට ය. නමුත් මෙයින් දුප්පත් පවුල්වලට ලැබුණු ප්‍රතිලාභය අඩුය. හම්බන්තොට ජනසවි සමීක්ෂණය අනුව එම පවුල්වලින් විදුලි බලය ලබාගෙන ඇත්තේ 5% කටත් අඩු පිරිසකි . මෙයින් පැහැදිලි වන්නේ දුප්පතුන් වෙත ප්‍රතිලාභ ලැබී ඇත්තේ මෙම වැඩසටහන්වලින් ඉතා අඩුවෙන් බවය. නමුත් ප්‍රතිලාභ දුප්පතුන් වෙත ළඟාකිරීම සංවර්ධනයේදී ඉතා වැදගත් වේ. මේ අනුව බලන විට ජනශක්ති බැංකු සංගම්වල 100% ක් ප්‍රතිලාභ ලැබෙන්නේ දුප්පත් පවුල්වීම සැළකිල්ලට ගත යුතු වැදගත් කරුණකි.

## දුප්පත් අම්මලාගේ ස්වශක්තිය කෙරෙහි තබන අචල විශ්වාසය

**ජනශක්ති බැංකු සංගම්** වැඩ සටහන **සම්පූර්ණයෙන්ම දුප්පත් අම්මලාගේ ස්වශක්තිය කෙරෙහි** විශ්වාසය තබා **ඇත්තෙකි**. රජයේ හෝ පිටස්තර මැදිහත්වීම අවම මට්ටමින් තබාගෙන ඇත. **මෙම බැංකු සංගම්වල අරමුදල් සඳහා එක සතයක්වත් රජයෙන් හෝ පිටස්තරයෙන් යොදා නැත**. එහෙත් පසුගිය මාස 07 තුළ රු. ලක්ෂ 17 ඉක්මවා මෙම බැංකු අරමුදල් ගොඩනගා ඇත.

බැංකු සංගම් කාර්යාල 20 සඳහා ලබා දී ඇත්තේ කුඩා යකඩ කබඩ් එකක් හා ගිණුම් පොත්පත් පමණි. කාර්යාල, ගමේ දුප්පත් ගෙදරක පවත්වා ගෙන යයි. ඒ සඳහා සතයක්වත් කුලියක් ගෙවනු නොලැබේ. බෝඩ් ලෑලි හා අනෙකුත් මේස, පුටු ආදී සියළු දේ සාමාජිකාවන්ගේය. මුදල් හා පරිපාලන ලේකම්වරියන් උසස් පෙළ සමත් අදාල බල ප්‍රදේශයේ කාන්තාවන්ය. ඒ අයට ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් ගෙවනු ලබන රු. 450 ක මාසික පුහුණු දීමනාව හැරුණු විට වෙන සතයක්වත් ගෙවනු නොලැබේ. ගමන් වියදම් දීමනා ගෙවීමක් නැත. බොහෝ ගම්මානවල පයින්ම ගමන් කරති. ගිණුම් ක්‍රම ගැන සුළු පුහුණුවකින් පසු ඒ අයම මැනවින් ගිණුම් තබන බව පරීක්ෂණවලදී අනාවරණය වී ඇත. මුදල්වල ආරක්ෂාවට රක්ෂණ ක්‍රම නැතිවාට ඔවුන්ගෙන් සතයක් හෝ නැතිවූ බවට හෝ හොරුගත් බවට පැමිණිලි නැත. මහ සභා රැස්වීම්, පාලක මණ්ඩල රැස්වීම් ඒ අය විසින්ම සංවිධානය කරනු ලබේ. මෙයින් දුප්පත් අම්මලාගේ ස්වශක්තිය කෙරෙහි තබන අචල විශ්වාසය පැහැදිලි වේ. දුප්පත්කමින් මිදීමේ ශක්තිය දුප්පත් අම්මලා වෙතම ඇති බවට තබන විශ්වාසය මෙම වැඩසටහනේ වැදගත්ම මූල ධර්මයක් වේ.

## භෞතික හා මානවීය ඒකාබද්ධ සංවර්ධනය

**ජනශක්ති බැංකු සංගම් වැඩසටහන හුදු ආර්ථික ක්‍රියාවලියක් පමණක් නොව, මානවීය හා භෞතික ඒකාබද්ධ සංවර්ධනයක් සඳහා කැපවුණු උත්සාහයක්.** ණය ලබාදීම හා ඉතිරිකිරීම් වැඩි කිරීම ප්‍රධාන ආර්ථික ක්‍රියාවලිය බව සත්‍යයකි. එහෙත් ලෙඩ - රෝග හා ආපදාවලට ණය ලබා දීම ජනශක්ති බැංකු සංගම්වලින් කෙරේ. සාමාන්‍ය බැංකු ආයතනවල මුදල් ගොඩගසා සිටියදී තවත් පැත්තකින් සුළු මුදලක් නැතිකම නිසා ලෙඩ දුකින් මියැදෙන දුප්පතුන් කොතෙක් ඇත්ද? මෙය මානව හිතවාදියෙකු දකින්නේ එක්තරා ජුගුප්සාජනක විහිළුවක් ලෙසය. 5 දෙනාගේ කණ්ඩායම් ක්‍රමය මගින් ග්‍රාමීය සමාජයේ පවත්නා අන්තර් පුද්ගල සම්බන්ධතා ශක්තිමත්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කිරීමට පියවර ගෙන ඇත. මහ සභා මගින් පාලක මණ්ඩල රැස්වීම් තුලින් කුඩා ගම්මාන කීපයක සම්බන්ධතා ශක්තිමත් වේ. පා ගමන් පුස්තකාල සේවය මගින් සාහිත්‍යය පිළිබඳ පොත පත ලබාදීමෙන් ආධ්‍යාත්මික තත්වය දියුණු කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම අකුරු කියවීමට හා ලිවීමට නොහැකි අය සඳහා සාක්ෂරභාවය දියුණු කිරීමට ද පා ගමන් පුස්තකාල සේවිකාවන් පියවර ගෙන ඇත. ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති මගින් පසුගිය කාලය තුළ සෞඛ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් දුප්පත් පවුල්වල සෞඛ්‍ය තත්වය ගොඩනැගීමට ප්‍රබල උත්සාහයක් ගෙන ඇත. එන්නත් නොකළ ළමුන්ට එන්නත් ලබා දීම කෙරේ. පරිසරය සුරැකීමේ වැඩ සටහනක් ද කාන්තා සමිති මගින් සිදු වේ. මෙ මගින් දුප්පත් පවුල්වල කුස්සි නැවත සෞඛ්‍යයට හිතකර අන්දමට සැකසීමේ වැඩසටහන් ද ගෙවත්ත දියුණු කිරීමේ වැඩසටහන්ද ක්‍රියාත්මක කරනු ලැබේ. වතුර උණු නොකර බොන ගෙවල් සොයමින් සෞඛ්‍ය හා සනීපාරක්ෂාව ගැන දුප්පතුන් දැනුවත් කරමින් ගෙවල් ගානේ යන කාන්තා සමිති නියෝජිතයින් ගම්මානවලදී හමුවිය හැකිය. මේ අනුව භෞතික මා මානවීය ඒකාබද්ධ සංවර්ධනය ගැන ජනශක්ති බැංකු සංගම් වැඩසටහන උනන්දුවක් දක්වා ඇත.

## මානව හරුත්වය හා සමාජ සාධාරණත්වය

ජනශක්ති බැංකු සංගම් වැඩසටහන ජාති, ආගම්, කුල හා දේශපාලන භේද ගැන නොතකයි. දුප්පත් පවුල්වල දුප්පත්කම නිසා සිදුවී ඇති අධ්‍යාත්මික පිරිහීම ගැන ඔවුන් මැනවින් අවබෝධ කර ගෙන ඇත. දුප්පතුන් තුල ඇති නිර්මාණ ශක්තිය, නායකත්ව ලක්ෂණ, ආරම්භක ශක්තිය, සමගියේ බලය, ජනශක්ති බැංකු සංගමය නිරතුරුවම විශ්වාසය තබයි. විශේෂයෙන් දුප්පත් කාන්තාවන් සමාජයේ අසාධාරණයට ලක්වූ පිරිසකි. ඒ බව හොඳින් වටහාගෙන සිටින හෙයින් ඔවුන්ව ආර්ථික වශයෙන් ශක්තිමත් සංවිධානයක් තුළට ගැනීම මෙම වැඩසටහන තුලින් අපේක්ෂා කරයි. දුප්පත් කාන්තාවන් ගැන සැළකීමේදි කාන්තාව අයිතීන් ගැන හඬ නැගීමෙන් පමණක් නොව ඔවුන්ට

ශක්තිය ලබා දීමෙන් සාධාරණත්වයක් ලබා දිය යුතු බව අපගේ විශ්වාසයයි.

ජනශක්ති බැංකු සංගම් මව් සංගමය වන දිස්ත්‍රික් කාන්තා මහ සංගමය මගින් හම්බන්තොට ජනාධිපති ජංගම සේවයේදී ගරු වනිතා කටයුතු ඇමතිතුමිය වෙත ඉල්ලීම් 07 ක් ඉදිරිපත් කරන ලදී. ඒවා අතර පළමු වන ඉල්ලීම වූයේ ලංකාවේ ආවාහ විවාහවලදී කාන්තාවන්ගෙන් දායාද ඉල්ලීම හා ගැනීම සම්පූර්ණයෙන්ම නීතියෙන් තහනම් කිරීමය. ඉංදියාව හා බංගලිදේශය වැනි රටවලත් දැවැද්ද දීම හා ගැනීම නීතියෙන් තහනම් කර ඇත්නම් ලංකාව වැනි බෞද්ධ සංස්කෘතියක් ඇති රටක එය නීතියෙන් තහනම් කිරීමට නොහැක්කේ මන්ද යන්න දිස්ත්‍රික් කාන්තා මහ සංගමය මතු කරන ප්‍රබල තර්කයයි. 21 වැනි සියවසට පා තැබීමට අරඅදින මෙවන් කාලයකදී දැවැද්ද දීමට නොමැතිකමින් තරුණ කාන්තාවන් ගෙවල්වල වයසට යන්නට දීමත්, එයින් දුප්පත් දෙමාපියන් නිරන්තර වේදනාවට පත්වීමට ඉඩ තැබීමත් මානව වර්ගයාටම කරනු ලබන සමච්චලයක් නොවන්නේද? මේ නිසා නීතිය ඉදිරියේදීවත් එය වෙනස් කිරීමට පියවර ගත යුතුව ඇත.

සමාජ සාධාරණත්වය ගැන සළකා බැලීමේදී දිස්ත්‍රික් කාන්තා මහ සංගමයේ ගරු සභාපතිනි, අශෝකා විතාරණ මෙනවියගේ ප්‍රකාශයක් ගෙන හැර දක්වමින් ලිපිය අවසන් කිරීමට කැමැත්තෙමි. 'මන්ද පෝෂණය, කුස ගින්න, විරැකියාව,ළදරු මරණ, දුක් අඳෝනා ගෙන දෙන දුප්පත්කමට ශාප වේවා. එහෙත් දුප්පතුන්ට විශේෂයෙන් දුප්පත් අම්මලාට අපි සැමදා ආදරය කරනවා. ඒ නිසා ඔවුන් නගා සිටුවීමට පියවර ගන්නවා.'

## දුප්පත් අම්මලා සංවිධානය වෙයි

වැලිආර, ගොන්නොරුව හා අලි ඔලුආරවැනි හම්බන්තොට ඈත පිටිසර ගම්මානවල සැරිසරන විට සිහියට නැගෙන්නේ ලෙනාඩ් වුල්ෆ්ගේ බැද්දේගම නවකථාවේ එන බබුන්ලා, සිතිඳුලා සහ පුංචි මැණිකෙලාය. එදා මෙන්ම අදත්

දුප්පත්කමින්, සමාජ ආසාධාරණයෙන් මෙම ගම්මු පිඩා විදිති. පසුගිය දිනවල ගොන්නෝරුව, බඳගිරිය වැනි ප්‍රදේශවල පැල්වල සිටින අහිංසක මිනිසුන් කිහිප දෙනෙකුම වල් අලින් විසින් පහරදී මරා දමා ඇත. මෙයින් ද අනාථ භාවයට පත් වූයේ දුප්පත් අම්මලා සමග දරු පැටවුන්ය. තවමත් හේනේ කුරහන්, බඩ ඉරිඟු ටික අයාලයේ යන ගවයින්ගෙන් විනාශ වූවා යැයි හඩා වැළපෙන අම්මලා හමුවේ. ඔවුන් හඩන්නේ දරු පැටවුනගේ බඩගින්නේ වේදනාවටය. තවමත් පාචනයෙන් මිය යන දරුවන් ගැන තැනින් තැන ඇසේ. බීමට වතුර නැතිව කළ ගෙඩි හිස තබාගෙන ඈත බිම්වලට ඇදෙන අම්මලා පිටිසර ගම්මානවල හමුවේ. දරු පැටවුන් ගණනාවක් සමග අම්මලා අතහැර යන ස්වාමි පුරුෂයන් ගැන ජනහමුවලදී අසන්නට ලැබේ. දරු පැටවුන් ජීවත් කරන්නට අරගලයක යෙදෙන මෙම අම්මලාට තව දුරටත් නාගරිකයන්ගේ අනුකම්පාවෙන් වැඩක් නැත. සහනාධාර ලබා දීමෙන් තව තවත් යැපුම් තත්වයකට ඇද දැමීම මෙයට ප්‍රතිකර්මයක් නොවේ.

පවුලේ බර උසුලන, දරුවන්ගේ බඩගින්නේ වේදනාව දැනෙන අම්මලා පැත්තකට දමා එම පවුල් නගා සිටුවිය හැකිද යන ප්‍රශ්නය ජනසවිය ආරම්භයේ දී අප විසින් මතු කරන ලදී. දුප්පත් පවුල් නගා සිටුවිය හැක්කේ එහි බර හා වගකීම උසුලන අම්මලා සම්බන්ධ කරගත් වැඩ සටහනකටය. ඒ සඳහා ස්වේච්ඡා සංවිධානයක් ගොඩනැඟීම කළ යුතු බව ජනසවිය ආරම්භයේදී අප තීරණය කර ගන්නා ලදී. කුඩා ගම්මාන 126 කින් සමන්විත හම්බන්තොට හා සූරියවැව උප දිසාපති කොට්ඨාශවල මුලින්ම කරන ලද්දේ දුප්පත් අම්මලා එක්තැන් කර ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති පිහිටුවීමයි. ඊට පසුව එම සමිතිවල සභාපතිනියන් එක් කර දිස්ත්‍රික් කාන්තා සංවර්ධන මහා සංගමය පිහිටුවන ලදි. භීෂණ සමයේදි වරින් වර යෝධගම, ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ආයතනයට සැතපුම් ගණන් පයින් හා ට්‍රැක්ටර්වලින් පැමිණි කාන්තාවෝ ජනසවිය ගැන සාකච්ඡාවලට සහභාගි වෙමින් මෙම කාන්තා සමිතිවල ප්‍රගතිය ප්‍රකාශ කළහ.

## සෞඛ්‍ය වැඩසටහන් තුළින් දුප්පත් පවුල් වෙත ප්‍රවේශ වීම

ජනසවිය ආරම්භයේදී කරන ලද පවුල් තොරතුරු සමීක්ෂණ අනුව එන්නත් නොකළ දරුවන් 31.4% ක් පමණ සිටිති. ජලය උණුකර නිවාගෙන පානය නොකරන පවුල් සංඛ්‍යාව 70% ක් පමණ වේ මදුරු තෙල් ඉසිය යුතු ගෙවල්වලින් 36% ක්ම ඒවා ඉසින්නේ නැත. වැඩි දෙනෙකු ණය ගැති වී ඇත්තේ සෞඛ්‍ය හේතුන් නිසාය.

ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති මුලින්ම අරඹන ලද්දේ දුප්පත් පවුල්වල සෞඛ්‍ය තත්වය නංවාලන වැඩ සටහන්ය. සෑම දුප්පත් පවුලකම මෙන් සෞඛ්‍ය ප්‍රශ්ණ ඇත. පානීය ජලය උණු කර නිවා ගැනීම, එන්නත් කළ යුතු දරුවන්ට වහාම එන්නත් ලබා දීම, වැසිකිළි පාවිච්චියේ වැදගත්කම, මැලේරියා ලේ පටල පරීක්ෂා කිරිම. මැලේරියා මර්ධන කටයුතු, පවුල් සංවිධාන ක්‍රම කියා දීම, කුස්සි නැවත සකස් කිරිම ආදී කටයුතු මුලින්ම දුප්පත් අම්මලා එක් වී කරන්නට විය. මේ සඳහා පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ හා මැලේරියා මර්ධන ව්‍යාපාරයේ නිලධාරින්ගේ නොමසුරු සහාය මෙම ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවලට ලැබුණි. මේ අතර වරින්වර ග්‍රාමීය කාන්තා නායිකාවන් යෝධගමට කැඳවා දැනුවත් කරන ලදී. දුප්පත් අම්මලාගේ විශේෂ ඇල්මක් ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවලට ඇති වීමට මෙම සෞඛ්‍ය වැඩසටහන මහෝපකාරී විය. සෞඛ්‍ය තත්වය නංවාලන්නේ නැතිව දුප්පත්කමින් මිදීම අසීරු බව අම්මලාට අවබෝධ කරන්නට විශාල ප්‍රයත්නයක දැනුදු ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති මගින් දරමින් සිටිති.

### පා ගමන් පුස්තකාල

හත්පෝරුව හා ගොඩවාය ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති මගින් ගෙයින් ගෙට ගොස් කපාගත් පත්තර කෑලි හා පරණ පොත් බෙදන්නට විය. කාන්තා සංවර්ධන මහා සංගමය මෙම අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් පා ගමන් පුස්තකාල 30 ක් අරඹා ඇත. මෙම පුස්තකාල සේවිකාවන් පැලෙන් පැලට, හේනෙන් හේනට ගමන් කරමින් පොත -

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

පත ගෙවල්වලට දීම පමණක් නොව එම ගෙවල්වල සෞඛ්‍ය ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීම ද කරනු ලැබේ අකුරු කියන්නට හා ලියන්නට බැරි තරුණියන් ද සිටින බව මෙම පුස්තකාල සේවිකාවන්ට අනාවරණය වීමෙන් පසුව ඒ සඳහා අකුරු ඉගැන්වීම ද තැනින් තැන අරඹා ඇත. කාන්තා සමිතියේදී මෙම වැඩ සටහනේ ප්‍රගතිය සාකච්ඡා කෙරේ. මීට අමතරව දිස්ත්‍රික් කාන්තා මහා සංගමය පුස්තකාල සේවිකාවන් සමඟ ඔවුන්ගේ ගැටළු ආදිය මාසික ව සාකච්ඡා කරනු ලැබේ. සම්ප්‍රදායානුකූල පුස්තකාල සේවයට තව දශක ගණනාවක් තුළදී වත් ඈත පිටිසර දුප්පත් අම්මලාගේ ගෙවලට පොත පත ලබා දිය හැකි යැයි සිතිය නොහැකිය. ඒ පසුබිම යටතේ පා ගමන් පුස්තකාල සේවය දුප්පත් පවුල් දැනුවත් කිරීමේ කාර්යයක යෙදී සිටීම වැදගත් කරුණකි.

## ජනශක්ති බැංකු සංගම් 20 ක්

ග්‍රාමීය ණයගැතිභාවය හා ඉතිරි කිරීම්වල ඌණතාවය ප්‍රබල ගැටළුවක් ලෙස මූලික සමීක්ෂණයෙන් අනාවරණය වේ. ජනසවිය ආරම්භ කරන විට ජනසවිලාභීන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ණය ගැති වී ඇති බව පෙණුනි. මේ නිසා දුප්පත් අම්මලා ප්‍රබල ආර්ථික සංවිධානයක් තුළට ගැනීමේ අවශ්‍යතාවය මතුවිය. ජනසවිය වැඩසටහන තුලින් ඇති කරන ලද කුඩා ගම්මානය ප්‍රජා සහභාගිත්වය අතින් සංවිධානයකට ඉතා යෝග්‍ය එකක් වේ. මේ නිසා ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති මෙම ඒකකය පදනම් කරගෙන පිහිටුවා ගන්නා ලද අතර එය ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ.

නමුත් කුඩා ගම්මාන මට්ටම ආර්ථික සංවිධානයක් ගොඩනැගීමට කුඩා වැඩිය. මේ නිසා ආර්ථික ඒකකයක් ලෙස පවත්වා ගැනීමත්, ප්‍රජා සහභාගිත්වය තහවුරු කර ගැනීමටත් හැකි ඒකකයක් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාවය මතු විය. කුඩා ගම්මාන 05 ත් 10 ත් අතර ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ කලාප 20 කට හම්බන්තොට, සූරියවැව උපදිසාපති කොට්ඨාශ දෙකේ බෙදාගැනීමක් කර ඒවායේ ජනශක්ති බැංකු සංගම් 20 ක් ඇති කරන ලදි.

මෙම ජනශක්ති බංකු සංගම් ඒකකය සියළුම අදාල කුඩා ගම්මාන සාමාජිකාවන්ට එක්විය හැකි බව පසුගිය කාලයේ පැවැති මහ සභා රැස්වීම් 38 කින් පමණ ඔප්පු වී ඇත.

මෙම වැඩ සටහන යටතේ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල සාමාජිකාවන් 5 දෙනාගේ කණ්ඩායම් වශයෙන් ගොනුවී මෙම ජනශක්ති බැංකු සංගම්වල සාමාජිකත්වය ලබාගෙන ඇත. අදාල ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල සභාපතිනියන් ජනශක්ති බැංකු සංගම්වල පාලක මණ්ඩලයට අයත් වේ. බැංකු සංගම්වල තීරණ ගැනීම මෙම පාලක මණ්ඩල රැස්වීම්වලදී සිදුවේ. සියළුම සාමාජිකාවන් සතියකට රු 1/- බැගින් සති 50 කදී රු 500/- කොටසක් බැංකු සංගමයේ ලබා ගත යුතුව ඇත. ජනශක්ති බැංකු සංගමයට ප්‍රදේශයේ උගත් කාන්තාවන් දෙදෙනෙකු මුදල් හා පරිපාලන ලේකම් වශයෙන් තෝරාගෙන විශේෂ පුහුණුවක් ලබා දී සේවයේ යොදවා ඇත. ණය ලබාදීම් පිළිබඳව මුල් තීරණය දෙන්නේ 5 දෙනාගේ කණ්ඩායම් තුළින්ය. ඒවායේ ප්‍රගතිය හා ණය ආපසු ගෙවීම සොයා බැලීම කිරීම ද 5 දෙනාගේ කණ්ඩායම් මගින් කරනු ලැබේ. ඒ සඳහා අම්මලා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වාගෙන යනු ලැබේ. දිස්ත්‍රික් කාන්තා සංවර්ධන මහ සංගමය මගින් ජනශක්ති බැංකු සභාපතිනියන් හා ලේකම්වරියන් සමඟ එක්ව මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් කරනු ලැබේ

ජනශක්ති බැංකු සංගම් පිහිටුවා දැන් මාස 06 ක් ගත වී ඇත.

## මුල් මාස හයේ ප්‍රගතිය

මෙම බැංකු සංගම් අරඹන ලද්දේ කිසිම මූලික අරමුදලක් නැතිවය. රුපියල් 10/- කොටස් වාරික 12 ක් ගෙවන තෙක් එනම් මාස 03 ක් යන තෙක් ණය ඉල්ලීමට සාමාජිකාවන්ට හිමිකමක් නැත. මේ අනුව ජනශක්ති බැංකු සංගම්වලට මාස 03 ක ණය ලබා දීමේ අත්දැකීමක් ඇත. පහත දක්වෙන්නේ මාස 06 ක අරමුදල් හා මාස 03 ක ණය ලබා දීමේ ප්‍රගතියයි.

| | | |
|---|---|---|
| මුළුඅරමුදල | : | රු.13,19,215.96 |
| කොටස් මුදල | : | රු.10,93,277.00 |
| ඉතිරි කිරීමේ තැන්පතු | : | රු. 1,30,357.50 |
| වෙනත් තැන්පතු | : | රු. 47,583.50 |
| ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව | : | 574 |
| ණය ලබා දී ඇති මුදල | : | රු. 8,52,470.00 |
| ණය ආපසු අය වී ඇති ප්‍රමාණය | : | රු. 1,46,224.60 |
| ණය ආපසු අය වී ඇති ප්‍රතිශතය | : | 98% |
| සාමාජික සංඛ්‍යාව | : | 5500. |

ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල මුළු සාමාජික සංඛ්‍යාව 5910 කි. ජනශක්ති බැංකු සංගම්වලට එයින් බැඳී ඇත්තේ 5500 කි. සාමාජිකත්වය ලබා ගැනීම පිළිබඳව කිසිම බලකිරීමක් කරන්නේ නැත. නමුත් ණය ලබාදීම ඇරඹීමත් සමඟ අත්දැකීමෙන් මෙම සංවිධානය ගැන පැහැදී දුප්පත් අම්මලාගේ සාමාජිකත්වය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. කන්න වගා ණය, ස්වයං රැකියා ණය, ධීවර ණය, අපදා ණය හා සුළු ව්‍යාපාරික ණය යන ණය වර්ග පහ දැනට ප්‍රදානය කරනු ලැබේ.

පවුල් 574 කට මාස 03 කදී ණය ලබාදීම ඉතා වැදගත්ය. පසුගිය වසර 1 1/2 ක කාලය තුළ රාජ්‍ය බැංකු 03 ක් ජනසවි වැඩසටහනට සම්බන්ධ වී සිටී. සාකච්ඡා සම්මන්ත්‍රණ හා සහාය කණ්ඩායම්වලින් ණය නියෝජිතයන් පත් කර පුහුණු කිරීම් ආදිය පසුගිය කාලයේ අප විසින් කරන ලදී. බැංකු සමග මාසික සමාලෝචනයක් පවත්වන ලදී. පසුගිය ප්‍රගති සමාලෝචනයේ තොරතුරු අනුව වසර 1 1/2 ක කාලය ජනසවි පවුල් වලට රාජ්‍ය බැංකුවලින් ණය ලබා දී ඇති අන්දමත්, පසුගිය මාස 03 තුළ දී ජනශක්ති බැංකු සංගම් ණය ලබා දී ඇති අන්දමත් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ලංකා බැංකුව | - | පවුල් 369 |
| මහජන බැංකුව | - | පවුල් 287 |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව | - | පවුල් 177 |
| ජනශක්ති බැංකු සංගමය | - | පවුල් 574 |

මෙම සංඛ්‍යා ලේඛන දෙස බලන විට ශතයක්වත් අරමුදලක් නැතිව ආරම්භ කළ ජනශක්ති බැංකු සංගම් මාස 03 ක කාලයක දී ආශ්චර්යයක් කරන්නට යොමු වී ඇති බව පෙනේ. ඉදිරි මාස 06 තුළදී ජනශක්ති බැංකු සංගම් අරමුදල් තරකරමින් කොතරම් පවුල් සංඛ්‍යාවක් වෙත ගමන් කරාවිද යන්න සිතීමටත් අපහසුය. කෙසේ වෙතත් ග්‍රාමීය ණයගැතිභාවය ගැන විමසන්නෙකුගේ ඇස් ඇරවෙන උත්තරයක් ජනශක්ති බැංකු සංගම් ලබා දේ යයි සිතමි. දැනට ණය ආපසු අයවීම් ඉතාමත් ඉහළ මට්ටමක පවතී. ඊට හේතුව වී ඇත්තේ අම්මලා 5 දෙනාගේ කණ්ඩායම් හා ජනශක්ති බැංකු සංගමය අතර පවත්නා සමීප සමාජ සම්බන්ධතාවයි.

## බැංකු ක්‍රියාවලියේ ඇතුල් පැත්ත

ජනශක්ති බැංකු සංගම් රු. ලක්ෂ 14 ක් පමණ අරමුදලක් දුප්පත් අම්මලාගෙන්ම ගොඩනගාගෙන ඇත. බැංකු සංගම් කාර්යාල දුප්පත් ගෙවල්වල කාමරවල පිහිටුවා ඇත. විමධ්‍යගත අයවැයෙන් ලැබුණු මුදලකින් ලිපිද්‍රව්‍ය හා යකඩ කබඩ් එකක් පමණක් මෙම බැංකු සංගම් කාර්යාලවලට ලබා දී ඇත හම්බන්තොට පැවැති ජනාධිපති ජංගම සේවාවේදී ගරු වනිතා කටයුතු අමාත්‍ය, රේණුකා හේරත් මැතිණිය විසින් මෙම බැංකු සංගම් සඳහා පා පැදි 10 ක් පරිත්‍යාග කර ඇත. නිවාඩු දින හෝ කාර්යාල වේලාවන් මෙම බැංකු සමහ ගනුදෙනු කිරීමේදී බලපාන්නේ නැත. ඕනෑම වේලාවක කාර්යාලවල ගිණුම් පරීක්ෂා කර තොරතුරු ලබා ගත හැකිය. මේ පිළිබඳව වරින්වර පුහුණුවීම් හා අධීක්ෂණ කටයුතු පමණක් සිදුවේ. පාලක මණ්ඩල රැස්වීම්/ මහ සභා රැස්වීම් අම්මලා විසින්ම මැනවින් සංවිධානය කරනු ලැබේ. බැංකු සංගම් සභාපතිනියන් මාසිකව රැස්වී ගැටළු සාකච්ඡා කරමින් අත්දැකීම් හුවමාරු කර ගනු ලැබේ. ඒ අනුව උපදෙස් පත්‍රිකා වරින්වර නිකුත් කෙරේ. දිස්ත්‍රික් කාන්තා මහ සභා රැස්වීම්වලදී ව්‍යවස්ථාව අවශ්‍යතා අනුව සංශෝධනය කරමින් නැවත නැවත හැඩ ගැසේ. ඇතැම් නාගරිකයන් සිතන අන්දමට දුප්පත් අම්මලා මෝඩ, කම්මැලි පිරිසක් නොවන බව මේ වැඩ සටහනෙන් මැනවින් ඔප්පු කර ඇත .

කුඩා ගම්මාන මට්ටමේ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිය දුප්පත් අම්මලාට සීමා වූ ස්වේච්ඡා සංවිධානයක් හඳුන්වා දී ඇත. විවිධ දෙපාර්තමේන්තු සේවාවන් විශේෂයෙන් සෞඛ්‍ය සේවාවන් ගමට ළඟාකර ගැනීමට මෙම සංවිධානය උපකාරී වේ. ජනශක්ති බැංකු සංගම් තුළින් දුප්පත් අම්මලා ප්‍රබල ආර්ථික සංවිධානයක් තුළට ගැනීමට උත්සාහ කර ඇත. මෙය දුප්පතුන්ට ණය ලබා දීමටත්, ඉතිරි කිරීම් වර්ධනයටත් මහඟු මඟක් වී ඇත. එමෙන්ම 5 දෙනාගේ කණ්ඩායම් මගින් දුප්පත් පවුල් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය වීමට හා සාකච්ඡා මගින් දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව ලැබේ. ජනසවිය වැඩ සටහන සමඟ ආරම්භ වූ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති ජනශක්ති බැංකු සංගම් හා දිස්ත්‍රික් කාන්තා මහ සංගමය මගින් දුප්පත් අම්මලාගේ නව සංවිධානයක් ගොඩනැඟෙමින් පවතී. මෙය දකුණෙන් බිහිවන නව ආදර්ශනයක් වනවාට සැක නැත.

මෙම ලිපිය අවසන් කිරීමට පසුබිය‍දා යෝධගම, ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ආයතනයේ ස්වේච්ඡා සංවිධාන වැඩමුළුවකදී වලව ගොඩවාය ජනශක්ති බැංකු සංගමයේ මුදල් ලේකම්, එච්.ඩී. චන්ද්‍රාවතී මහත්මිය කළ ප්‍රකාශයක් ගෙන හැර දක්වීමට කැමැත්තෙමි. 'දුප්පතුන් සිටින්නේ ජනශක්ති බැංකු සඳහා නොවේ. ජනශක්ති බැංකුව දුප්පතුන් සඳහාය. දුප්පතුන් ඉන්නා තාක්කල් අපට ජනශක්ති බැංකුව ඕන. දුප්පතුන් නැති වූ දාට ජනශක්ති බැංකුව ඉතිහාසයේ කටුගෙට ඇද දානවා. එදාට එය අප කරන්නේ සන්තෝෂයෙනි.'

## ජනශක්ති බැංකු සංගමයේ ව්‍යවස්ථාව

(1990 ජූලි)

1. නාමය :- ජනශක්ති බැංකු සංගමය ..........................වේ.
2. ලිපිනය :- ජනශක්ති බැංකු සංගමය ..........................වේ.
3. බලප්‍රදේශය :- හම්බන්තොට දිස්ත්‍රික්කයේ .................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................ යන ග්‍රාම නිලධාරි කොට්ඨාශවල පරිපාලන සීමාවන් බල ප්‍රදේශයට අයත් වේ.

4. පරමාථ:-

4 :01. දුප්පත් කාන්තාවන්ට හා ඔවුනගේ පවුලේ අයට ආදායම් වැඩිකර ගැනීම සඳහා ස්වයං රැකියා සඳහා ණය ලබා දීම.

4 :02. දුප්පත් පවුල්වල ඉතිරි කිරීම් වැඩි කිරීමට අනුබල දීම.

4 :03. දුප්පත් පවුල්වල හදිසි ආපදාවන්ට හා රෝගී අවස්ථාවන්ට ණය පහසුකම් ලබා දීම.

4 :04. දුප්පත් කාන්තාවන් ග්‍රාමීය හා නාගරික ගිණි පොළී කරුවන්ගේ ග්‍රහණයෙන් බේරා ගැනීම.

4 :05. දුප්පත් කාන්තාවන් ආර්ථික වශයෙන් ශක්තිමත් සංවිධානයක් තුළට ගැනීම.

5. ප්‍රාග්ධනය:-

5 : 01. පහත සඳහන් අන්දමට බැංකුවේ ප්‍රාග්ධනය සමන්විත වේ.

i. සාමාජිකාවන්ගේ කොටස් මුදල්.
ii. සාමාජිකාවන්ගේ ඉතිරි කිරීම්.
iii. දේශිය හා විදේශීය ප්‍රදානයන්.
iv. බාහිර ණය මුදල්.
v. බැංකුවේ ලාභ මුදල්.

6. සාමාජිකත්වය:-

6 : 01. හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමයේ ශාඛාවන් වූ කුඩා ගම්මාන මට්ටමේ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල සාමාජිකාවන්ට මෙම බැංකු සංගමයේ සාමාජිකත්වය ලබා ගත හැකිය.

6 : 02. ඉහත 5: 01 යටතේ සුදුසුකම් ඇති පවුලක එක සාමාජිකාවකට පමණක් සාමාජිකත්වය ලබාගත හැකිය.

6 : 03. සාමාජිකත්වය ලැබීමට බැංකු සංගමයේ රු: 500/- ක කොටසක් ලබා ගැනීමට එකඟ විය යුතුය. මෙම කොටස් මුදල සතියකට රු: 10/- බැගින් සති 50 කදි ගෙවිය හැකිය.

6 : 04. සාමාජික කොටස් මුදල් සඳහා පොලියක් ගෙවිය යුතුය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

6 : 05. සාමාජිකත්වය ලබා ගැනීමට නියමිත ආකෘති පත්‍රය පුරවා පස්දෙනාගේ කණ්ඩායමේ නායිකාව මගින් ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරික වෙත ඉදිරිපත් කළ යුතුය.

6 : 06. සාමාජිකත්ව ඉල්ලුම් පත්‍රය සළකා බැලීමෙන් පසුව පාලක මණ්ඩලයට සාමාජිකත්වය පිරිනැමීම පිළිබඳ තීරණයක් ගැනීමට පුළුවන. පාලක මණ්ඩලයේ තීරණයකට විරුද්ධව ක්‍රියා කළ හැක්කේ මහ සභාවට පමණි

6 : 07. සාමාජිකත්ව ඉල්ලුම් පත්‍ර ලේඛණය බැංකු සංගමයේ සාමාජික ලේඛණය වේ.

6 : 08. සාමාජිකාවන්ට ණය පහසුකම් සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට හිමිකම ලැබෙන්නේ කොටස් වාරික 12 ක් නොකඩවා නියි පරිදි ගෙවීම් කිරීමෙන් පසුවය.

6 : 09. සාමාජික ඉල්ලුම් පත්‍රයේ තමන්ගෙන් පසු අයිතිය සඳහා පසු උරුමකරුවෙකු නම් කළ යුතුය.

6 : 10. සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වුවහොත් ඇයගෙන් බැංකු සංගමයට අයකර ගැනීමට මුදලක් ඇත්නම් එයඅයකරගෙන ඉතිරිය ගෙවිය හැකිය.

## 7 මහාසභාව

7 : 01. බැංකු සංගමයේ සාමාජිකත්වය ලබාගෙන ඇති ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල සියළුම සාමාජිකාවන් මහ සභාවට අයත් වේ.

7 : 02. වර්ශයකට වරක්වත් මහ සභා රැස්වීමක් පැවැත්විය යුතුය.

7 : 03. මහ සභා රැස්වීම කැඳවීම බැංකු සංගමයේ පරිපාලන ලේකම් විසින් පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි කළ යුතුය. දින 07 කටවත් කලින් ඒ පිළිබඳව සාමාජිකාවන්ට දැනුම් දිය යුතුය.

7 : 04. වාර්ෂික මහ සභා රැස්වීමට අයවැය ලේඛණය හා ගිණුම් වාර්තාව ද පාලක මණ්ඩලය විසින් ඉදිරිපත් කර අනුමත කරගත යුතුය.

7 : 05. සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට පාලක මණ්ඩලය ගන්නා ලද තීරණය අනුමත නොකර සිටීමට මහ සභාවට පුළුවන. එවිට පාලක මණ්ඩලය ගන්නා ලද තීරණය අහෝසි වේ.

7 : 06. බැංකු සංගමයේ රුපියල් ලක්ෂයකට වැඩි වත්කම් විකිණීම හා අන්සතු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය ඇත්තේ මහ සභාවටය. විශේෂ හදිසි අවස්ථාවක මේ පිළිබඳව තීරණයක් පාලක මණ්ඩලය විසින් ගනු ලැබුව හොත්, දින 14 ක් ගත වීමට පෙර ඒ පිළිබඳව මහ සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

7 : 07. මහ සභාවේ මුලසුන පාලක මණ්ඩලයේ සභාපතිනිය වෙත හිමිවේ. ඇය නොමැති අවස්ථාවකදී උප සභාපතිනියටත්, ඇයත් නොමැති අවස්ථාවකදී පාලක මණ්ඩලයේ අනෙක් සාමාජිකාවන්ටත් මුලසුන ගත හැකිය.

7 : 08 මහ සභාවේ සියළුම වාර්තා තැබීම් පරිපාලන ලේකම්වරිය විසින් කළ යුතුය.

7 : 09. මහ සභාවේ මුළු සමාජික සංඛ්‍යාවෙන් 1/4 ක් හෝ 25 දෙනෙකු යන දෙකේ අඩු සංඛ්‍යාවක් මහ සභාවේ සත පූර්ණය ලෙස සැළකේ.

7 : 10. ව්‍යවස්ථාව සංශෝධනය කළ හැක්කේ හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමයේ එකඟත්වය මත මහ සභාවේ සාමාජකත්වයෙන් 2/3 කගේ කැමැත්ත තුළින් ගන්නා මහ සභා තීරණයකට පමණි.

## 8. පාලක මණ්ඩලය:-

8 : 01. අදාල බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල සභාපතිනියන් පාලක මණ්ඩලයට අයත් වේ.

8 : 02. බල ප්‍රදේශය තුළ ග්‍රාම නිලධාරීන් ද පාලක මණ්ඩලයට ඇතුළත් වේ. එහෙත් සභාපති, උපසභාපති ආදි තනතුරුවලට පත්වීමට හෝ ඡන්දය දීමට හෝ මෙම නිලධාරීන්ට බලයක් නැත.

8 : 03. පාලක මණ්ඩලය අඩුම වශයෙන් මසකට දෙවරක්වත් රැස්විය යුතුය.

8 : 04.මෙම ව්‍යවස්ථාවේ සීමාවන් හැරුණුවිට මහ සභාව සතු සියළු බලතල පාවිච්චි කිරීමේ විධායක බලය පාලක මණ්ඩලය සතුවේ.

8 : 05. පාලක මණ්ඩලය තම පළමුවන රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභාපතිනියක් හා උප සභාපතිනියක් තෝරා ගත යුතුය. එහි කාලය වර්ෂයකට සීමාවේ. ඊළඟ වර්ෂයේදී නැවත රැස්වී සභාපතිනියක් හා උප සභාපතිනියක් තේරීම පාලක මණ්ඩලය විසින් කළ යුතුව ඇත.

8 : 06 පාලක මංඩල රැස්වීම් වල මුලසුන සභාපතිනිය විසින් ගත යුතු අතර, ඇ නොමැති අවස්ථා වලදී උප සභාපතිනියද, ඇයත් නොමැති අවස්ථා වලදී පාලක මංඩලයේ වෙනත් සමාජිකාවන් මුලසුන ගත යුතුව ඇත.

8 : 07. පාලක මණ්ඩලයේ සාමාජිකත්වය අදාල ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ සභාපතිත්වය අහෝසි වීමත් සමඟම අහෝසි වේ. එවිට ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ අළුතින් පත්වන සභාපතිනියට පාලක මණ්ඩලයේ සාමාජිකත්වය හිමි වේ.

8 : 08. බැංකු සංගමයේ නීතිරීතිවලට පටහැනිව ක්‍රියාකරන සාමාජිකාවන් නෙරපා හැරීමේ බලය පාලක මණ්ඩලයට ඇත. මෙවැනි තීරණයක් ගත්විට ඒ පිළිබඳව හම්බන්තොට දිස්ත්‍රික් කාන්තා සංවර්ධන මහ සංගමයටත් ඊළඟට රැස්වන මහ සභාවටත් දැනුම් දිය යුතුය.

8 : 09. විශේෂ මහ සභා රැස්වීම් කැඳවීමේ බලය පාලක මණ්ඩලයට ඇත.

8 : 10. රජයේ හෝ වානිජ බැංකුවක බැංකු ගිණුම් ආරම්භ කිරිමේ තීරණය ගැනීම පාලක මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් කළ යුතුය. එම මෙහෙයවීමට සභාපතිනියට හෝ උප සභාපතිනියට හා මුදල් ලේකම් හා පරිපාලන ලේකම්ට පුළුවන.

8 : 11. පිටණය සීමාවන් තීරණය කිරිමට පාලක මණ්ඩලයට හැකිය. නමුත් මෙම තීරණ ගත්විට

ඊට ආසන්නයේ පැවැත්වෙන මහ සභාවට එය ඉදිරිපත් කර අනුමත කරගත යුතු වේ.

8 : 12. පාලක මණ්ඩල තීරණ හැකිතාක් ඒකමතිකව ගැනීමට උත්සාහ ගත යුතුය. එහෙත් ඒකමතික තීරණයක් ගත නොහැකි අවස්ථාවක ඡන්ද විමසීමක් කළ යුතුය. ඡන්ද සමාන වූ අවස්ථාවක අතිරේක තීරක ඡන්දයක් මුලසුනට හිමිවේ.

8 : 13. සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටීන් සකස් කිරීම, ඒ සඳහා බඳවා ගැනීම් කිරීම, සේවකයින් පිළිබඳ විනායුකූලව කටයුතු කිරීම පාලක මණ්ඩලය විසින් කළ යුතුය. මෙවැනි අවස්ථාවලදී හැකිතාක් කාන්තා මහ සංගමයේ උපදෙස් මත ක්‍රියා කළ යුතුය.

8 : 14. ණය ඉල්ලුම්පත් සළකා බලා ණය අනුමත කිරීමේ සම්පූර්ණ බලය පාලක මණ්ඩලයට පැවරේ. කාන්තා මහ සංගමය විසින් මේ පිළිබඳව වරින්වර ලබාදෙන උපදෙස් පිළිපැදීමට පාලක මණ්ඩලය බැඳී ඇත.

8 : 15. ණය සඳහා පොළී අනුපාතය තීරණය කිරීම, ඉතිරි කිරීම් සඳහා පොලී අනුපාතය තීරණය කිරීම, කොටස් මුදල් සඳහා පොලී අනුපාතය තිරණය කිරීම

ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, වාරික ගෙවීම පැහැර හරින්නන් සඳහා දඩුවම් නියම කිරීම ආදි කටයුතු කිරීමේ සම්පූර්ණ බලය පාලක මණ්ඩලයට ඇත. එහෙත් මෙවැනි අවස්ථාවලදී කාන්තා මහ සංගමයේ උපදෙස් පිළිපැදිමට පාලක මණ්ඩලය බැඳී ඇත.

8 : 16 තමාගේ කොටස් වාරිකය හෝ ණය වාරිකය පිළිගත් හේතුවක් නොමැතිව වාර තුනකට වඩා නොගෙවා තිබීම පාලක මණ්ඩල සාමාජිකාවක විසින් කරනු ලබන බරපතල වරදක් වේ. මෙවැනි අවස්ථාවක පාලක මණ්ඩලය විසින් ඒ පිළිබඳව අදාල ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියටත් කාන්තා මහ සංගමයටත් වාර්තා කළ යුතුයි.

8 : 17. පිට පිට වාර තුනක් සාධාරණ හේතුවක් නොමැතිව පාලක මණ්ඩල රැස්වීම්වලට සහභාගි

නොවීම පාලක මණ්ඩල සාමාජිකාවක් විසින් කරනු ලබන වරදක් වේ.

8 ፡ 18 ඉහත 8 ፡ 16 හා 8 ፡ 17 යටතේ හෝ වෙනත් බැංකු සංගමයේ කීර්ති නාමයට හානි කරන කටයුත්තක කිසියම් පාලකවරියක් ක්‍රියා කරන්නේ නම්, කාන්තා මහ සංගමය විසින් අදාල ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ මහ සභා රැස්වීමක් කැඳවා වෙනත් සභාපතිනියක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.

8 ፡ 19. පාලක මණ්ඩලයෙන් ඉවත් වීමට කිසියම් ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියක සභාපතිනියක් අපේක්ෂා කරන්නේ නම්, ඇය විසින් ඊට පෙර තම ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ සභාපතිකමින් අස්විය යුතුව ඇත.

8 ፡ 20. පාලක මණ්ඩල සාමාජිකාවකට බැංකු සංගමයේ ණය යෝජනා ක්‍රමවලින් ණය ලබාගැනීමට ඉල්ලුම් කළ හැක්කේ නියමිත අතිකුත් සුදුසුකම් ද සහිතව මාස 06 ක කාලයකට පසුවය.

8 ፡ 21. පාලක මණ්ඩලය විසින් සියළු ගනුදෙනු හා වාර්තා, ගිනුම් ආදිය ලිඛිතව තැබීමට සැළැස්විය යුතුය.

8 ፡ 22. පරිපාලන ලේකම්ගේ හා මුදල් ලේකම්ගේ වගකීම් නිසි පරිදි ඉෂ්ඨ වන්නේද යන්න පිළිබඳ අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ බලය සභාපති ඇතුළු පාලක මණ්ඩලය සතුය.

8 ፡ 23. වාර්ෂික ගණන් පරීක්ෂණයක් පවත්වා ලාභාලාභ ගිනුම්, ශේෂ පත්‍රයක් සකස් කිරීම පාලක මණ්ඩලය විසින් කළ යුතුය. මේ පිළිබඳ වාර්තාවක් මුදල් ලේකම් මගින් වාර්ෂික මහ සභාවට ඉදිරිපත් කළ යුතුය.

8 ፡ 24. පාලක මණ්ඩලය තම කටයුතු බුද්ධිමත් ලෙස ඉටුකළ යුතු වේ සැමවිටම නීතිය හා මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. පාලක මණ්ඩලය නිසි පරිදි බුද්ධිමත් ලෙස ක්‍රියා නොකිරීම නිසා හෝ නීතිය හා මෙම ව්‍යවස්ථාව අනුව ක්‍රියා නොකිරීම නිසා හෝ සමිතියට ඇතිවන යම්කිසි අලාභයකට හෝ

පිඩාවකට හෝ සමිතිය යටත්වන දඩුවමකට හෝ පාලක මණ්ඩලයේ සාමාජිකාවන් එක්ව හා වෙන් වෙන්ව වගකිව යුතු වන්නේය.

9. පරිපාලන ලේකම්:-

9 : 01.බැංකු සංගමයට පරිපාලන ලේකම් තනතුරක් ඇත. ඒ සඳහා බල ප්‍රදේශය තුළ පදිංචි සුදුසුකම් ඇති කාන්තාවක් තෝරාගත හැකිය.

9 : 02. බැංකු සංගමය මගින් පළමු වන වර්ෂය සඳහා පරිපාලන ලේකම් තනතුර සඳහා ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පුහුණුවීමේ දීමනාවක් ගෙවනු ලැබේ නමුත් ඒ ළඟ වර්ෂයේ සිට බැංකු සංගමය විසින් මෙම පරිපාලන ලේකම්වරියට දීමනාවක් හෝ වැටුපක් ගෙවිය යුතුය.

9 : 03. පාලක මණ්ඩල රැස්වීම් කැඳවීම, ඒවායේ වාර්තා නිසි පරිදි තැබීම. එම තීරණ ක්‍රියාත්මක කිරීම, පරිපාලන ලේකම් ගේ වගකීම වේ

9 : 04. බැංකු සංගමයේ මහ සභා රැස්වීම් කැඳවීම, ඒවායේ වාර්තා තැබීම, වාර්ෂික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරිම පරිපාලන ලේකම්ට පැවරේ

9 : 05 සාමාජිකත්ව ලේඛන නිසි පරිදි පත්වාගෙන යෑම, සාමාජික ඉල්ලුම් පත් නිසි පරිදි ග්‍රාමීය කාන්තා සමිතිවලට ලබාදීම. ඒවා ආපසු ලැබුණුවිට පාලක මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම ආදි වගකීම් පරිපාලන ලේකම්ට පැවරේ

9 : 06. සමිතියේ ව්‍යවස්ථාව හා මුද්‍රාව සුරක්ෂිතව තබා ගැනීම පරිපාලන ලේකම් විසින්ම කළ යුතුය.

9 : 07 කාන්තා සමිතිවලින් ඉදිරිපත් වන ණය ඉල්ලුම්පත්‍ර මුදල් ලේකම්ගේ නිර්දේශය ලබාගෙන පාලක මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කිරීම පරිපාලන ලේකම් විසින් කළ යුතුය.

9 : 08. පරිපාලන ලේකම් ඉවත් කිරීමේ බලය පාලක මණ්ඩලයට ඇත. එහෙත් එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක්

කාන්තා සංවර්ධන මහ සංගමයට ඉදිරිපත් කර අනුමත කරගත යුතුය.

9 : 09. ග්‍රාමීය කාන්තා සමිතිවල ක්‍රියාකාරිත්වය සුපරීක්ෂාවෙන් සිට ඒවායේ තත්වය පිළිබඳව පාලක මණ්ඩලයට වාර්තා කිරීම පරිපාලන ලේකම් විසින් කළ යුතුය.

9 : 10. පාලක මණ්ඩලයට නිවැරදි තීරණ ගැනීමට පහසු වන අන්දමට මාණ්ඩලික පත්‍රිකා මගින් ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට පරිපාලන ලේකම් උත්සාහ කළ යුතුය

10 මුදල් ලේකම් :-

10 :01. බැංකු සංගමයට මුදල් ලේකම් තනතුරක් ඇත. ඒ සඳහා බල ප්‍රදේශය තුළ සුදුසුකම් ඇති කාන්තාවක් තෝරාගත යුතුය.

10 :02. ප්‍රථම මුදල් ලේකම් තනතුර සඳහා ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් කෙනෙකු තෝරාගනු ලැබේ . ඒ සඳහා වර්ෂයක් යන තෙක් පුහුණු දීමනාවක් ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් ගෙවනු ලැබේ.

10 :03. වර්ෂයක කාලයකින් පසු ඉහත සඳහන් මුදල් ලේකම් සඳහා දීමනාවක් හෝ වැටුපක් ගෙවීම බැංකු සංගමය මගින් කළ යුතුය. මේ සඳහා හම්බන්තොට කාන්තා මහ සංගමයේ උපදෙස් ලබාගත යුතුය.

10 :04 මුදල් ලේකම් ඉවත් කිරීමේ බලය පාලක මණ්ඩලයට ඇත. එහෙත් මෙවැනි අවස්ථාවක කාන්තා මහ සංගමයට වාර්තා කර උපදෙස් ලබාගත යුතුව ඇත.

10 :05 පාලක මණ්ඩලය වෙනුවෙන් බැංකු සංගමයේ මුදල් කටයුතු පිළිබඳව සම්පූර්ණ විධායක බලය ඇත්තේ මුදල් ලේකම්ටය.

10 :06. බැංකු සංගමයේ සියළුම ගිණුම් කටයුතු නිවරදිව තැබීමේ වගකීම මුදල් ලේකම්ට පැවරේ.

10 :07. පාලක මණ්ඩල රැස්වීම්වලට බැංකු සංගමයේ

මුදල් තත්වය පිළිබඳ වාර්තාවක් මුදල් ලේකම් විසින් ඉදිරිපත් කළ යුතුය.

10 :08. කාන්තා මහ සංගමයට ගිනුම් තත්වය පිළිබඳ ඉල්ලනු ලබන වාර්තා නිසි පරිදි යැවීම මුදල් ලේකම් විසින් කළ යුතුය.

10 :09 සාමාජික කොටස් මුදල් එකතු වීම පිළිබඳවත්, ණය වාරික අයවීම පිළිබඳවත් සොයා බලා වාර්තා කිරීමේ සම්පූර්ණ වගකීම මුදල් ලේකම්ට පැවරේ.

10 :10. පාලක මණ්ඩල රැස්වීම්වලට සියළුම ණය ඉල්ලුම්පත් පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් ලේකම් විසින් කළ යුතුය.

10 :11. බැංකු සංගමය සතු සියළුම මුදල් පාලක මණ්ඩලයේ අවසරයක් නොමැතිව අත තබා නොගත යුතුය. ඒවා නොපමාව අදාල රජයේ හෝ වාණිජ බැංකුවක තැන්පත් කිරීම මුදල් ලේකම්ගේ වගකීම වේ

10 :12. වාර්ෂික ලාබාලාභ ගිනුම හා ශේෂ පත්‍රය සකස් කර පාලක මණ්ඩලය මගින් වාර්ෂික මහ සභාවට ඉදිරිපත් කිරීමේ වගකීම මුදල් ලේකම්ට පැවරේ

10 :13. සමිතියේ දේපළ ද, ගිණුම් පොත් වාර්තා ආදිය ද සුරක්ෂිතව තබා ගැනීම මුදල් ලේකම්ගේ වගකීමකි.

## 11. වත්කම් හා බැරකම්: -

11 : 01 බැංකු සංගමයේ සියළුම වත්කම් හා බැරකම්වල භාරකාරත්වය මහා සභාව වෙනුවෙන් පාලක මණ්ඩලයට පැවරේ.

11 : 02. පාලක මණ්ඩලයේ ඉහත බාරකාරත්වය පිළිබඳ විධායක කටයුතු මුදල් ලේකම් විසින් කරනු ලැබේ.

11 : 03. වත්කම් විකිණීම, බදු දීම හා මිලදී ගැනීම පාලක මණ්ඩලයේ තීරණය පරිදි කළ යුතුය.

රු. ලක්ෂ එකකට වැඩි විකිණීමක් හෝ අන්සතු කිරීමක් පිළිබඳව වූ අවස්ථාවක ඒ පිළිබඳව මහ සභාවේ පූර්ණ අනුමැතිය ලබාගත යුතුය.

12 ව්‍යාපාරික කටයුතු :-

12 :01. මෙම ව්‍යවස්ථාවේ පරමාර්ථවලට එකඟව ණය සැපයුම් හා ඉතිරි කිරීම් වර්ධනය කිරීම බැංකු සංගමය සතු ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වේ. ඊට අමතරව බැංකු සංගමයේ රැස්වන මුදල් ඵලදායී ආයෝජන කටයුතුවල යෙදීමට පාලක මණ්ඩලයට බලය ඇත.

12 :02 බැංකු සංගමය විසින් ප්‍රධාන ණය යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක කෙරේ. එනම්

1. සංවර්ධන ණය.

11. ආපදා හෝ හදිසි රෝගී ණය.

12 :03. සංවර්ධන ණය ලෙස සළකනු, ලබන්නේ සාමාජිකාවන්ගේ ආදායම් තත්වය නගා සිටුවන හා ස්වයං රැකියා බිහිකරන ව්‍යාපෘතීන් සඳහා ලබාදෙන ණයයි.

12 :04. ආපදා ණය වශයෙන් නියං, සුළි සුළං, ගංවතුර වැනි හා අලි පාළු, ගව පාළු වැනි හේතුන් මත ඉල්ලන ණය සළකනු ලැබේ. පවුලේ අයෙකුගේ බරපතල අසනීප තත්වයක් හේතුකොට ගෙන ඉල්ලනු ලබන ණය රෝගී ණය ලෙස සළකනු ලැබේ.

12 :05. මෙම ණය වර්ගවලට අය කරනු ලබන පොලී ප්‍රමාණයන් පිළිබඳව උපදෙස් කාන්තා මහ සංගමය මගින් ලබා දෙනු ලබන අතර, ඒ පිළිබඳව තීරණ ගැනීම පාලක මණ්ඩලය විසින් කරනු ලැබේ.

12 :06 සියළුම ණය පොළියත් සමඟ සති වාර 52 කින් අය කරනු ලැබේ. ණය නිකුත් කළ පසු ඊ ළඟ සතියේ සිට ණය වාරික අය කරනු ලැබේ.

12 :07. ණය වාරික ගෙවීම් ප්‍රමාද කිරීම වෙනුවෙන් දඩ මුදල් නියම කිරීමට පාලක මණ්ඩලයට බලය

ඇත. කෙසේ වෙතත් එම දඩ මුදල ණය වාරිකයෙන් 10% කට වඩා වැඩි නොවිය යුතුය.

12 ·08. ණය ඉල්ලුම්පතක් ඉදිරිපත් විය යුත්තේ පස් දෙනාගේ කණ්ඩායම මාර්ගයෙන්ය. ණය ගෙවීම පිළිබඳ සම්පූර්ණ වගකීම ණය ඉල්ලුම්කරු ඇතුළු පස්දෙනාගේ කණ්ඩායම වෙත පැවරේ. මෙම වගකීම් පස් දෙනාගේ කණ්ඩායමට ඉසිලීමට අසමත් වන අවස්ථාවල අදාල ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියට ද ව්‍යාප්ත වේ.

12 ·09. ණය ඉල්ලුම් පතක් ඉදිරිපත් කිරීමට හිමිකම ලැබෙන්නේ නොකඩවා සති 12 කට කොටස් වාරික ගෙවූ පස්දෙනාගේ කණ්ඩායමට ඇතුළත් සාමාජිකාවන්ටය.

12 ·10. කාරක සභා සාමාජිකාවන්ට ණය ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැක්කේ නොකඩවා සති 24 ක කොටස් වාරික ගෙවීමෙන් පසුවයි. ඔවුන්ද පස් දෙනාගේ කණ්ඩායමට ඇතුළත් විය යුතුය.

12 ·11. කොටස් වාරික හා ණය වාරික ගෙවීම පැහැර හරින පස්දෙනාගේ කණ්ඩායම්වල අළුත් ණය නොකළ යුතුය.

12 ·12. ණය ලබා ගන්නා සාමාජිකාවන් එම කණ්ඩායමත් අදාල ග්‍රමීය කාන්තා සංවර්ධන සමිතියත් ලබා ගන්නා ණය ආපසු ගෙවීම පිළිබඳ වගකීමකට බැඳේ.

12 ·13 ණය වාරික ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරික වෙත ගෙවිය යුතුය. භාණ්ඩාගාරික විසින් අදාල රිසිට් පත් නිකුත් කර සටහන් ආදිය තබා එම මුදල් බැංකු සංගමයේ මුදල් ලේකම් වෙත ලැබීමට සැළැස්විය යුතුය.

12 ·14 ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරික විසින් ණය වාරික හෝ කොටස් වශයෙන් තිසි පරිදි නොලැබෙන බව දැනගත් විගස ඒ පිළිබඳව වහාම කණ්ඩායම් නායකයාටත් සභාපතිවරියටත් දැනුම් දිය යුතුය.

12 :15. ඉහත 12 : 14 යටතේ දැනුම් දීමෙන් පසුව සති දෙකක් තුළ එහි ප්‍රගතියක් නොමැති නම් වහාම ඒ බව බැංකු සංගමයේ මුදල් ලේකම් වෙත වාර්තා කළ යුතුය. මුදල් ලේකම් මේ පිළිබඳව විශේෂ දැනුම් දීමක් ණය ගත් සාමාජිකාවකට හා කණ්ඩායම් නායිකාවට කර ප්‍රගතියක් නොමැතිනම් ඊලඟට රැස්වන පාලක මණ්ඩලයට මේ පිළිබඳව විස්තර හා නිර්දේශ සහිතව වාර්ථාවක් ඉදිරිපත් කළ යුතුය

12 :16. බැංකු සංගමයේ වත්කම් හැකිතාක් සාමාජිකාවන්ගේ ණය පහසුකම් සඳහා වෙන් කළ යුතුය එහෙත් අතිරික්ත මුදල් තිබෙන්නේ නම් එය වඩාත් ඵලදායි අන්දමට ආයෝජනය කිරීමට පාලක මණ්ඩලයට පුළුවන.

12 :17 සමාජිකාවන්ගේ ඉතිරි කිරීම් ඔවුන් ඉල්ලන අවස්ථාවලදී දිය යුතුව ඇත. එම නිසා එම මුදල් ඉල්ලුම් සපුරාලීමට ප්‍රමාණවත් පරිදි රඳවා ගැනීමට පාලක මණ්ඩලය වගබලා ගත යුතුය. මුදල් ලේකම් අවස්ථානුකූලව මේ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

12 :18. ඉතිරි කිරීම සඳහා තැන්පත්කරුවන් සෑහීමකට පත්වන අන්දමේ පොලියක් ගෙවිය යුතුය. මේ පිළිබඳව කාන්තා මහ සංගමයේ උපදෙස් පිළිපැදීමට පාලක මණ්ඩලය බැඳී ඇත.

## 13 පස්දෙනාගේ කණ්ඩායම:-

13 : 01. ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති සාමාජිකාවන්ට තම කැමැත්ත මත හෝ නිෂ්පාදන කටයුතුවල/ සේවාවන්වල නිරත වී සිටින අන්දම මත හෝ භූගෝලීය වශයෙන් පදිංචි වී සිටින ආකාරය මත හෝ පස්දෙනාගේ කණ්ඩායම් ඇති කර ගත හැකිය.

13 : 02. මෙවැනි පස්දෙනාගේ කණ්ඩායමක නායිකාවක් සිටිය_ යුතුය. එම කණ්ඩායමට කැමැති අයෙකු වර්ෂයක කාලයක් සඳහා නායිකාව වශයෙන් තෝරා ගත හැකිය.

වර්ෂයක කාලයකින් පසුව වෙනත් කණ්ඩායම් සාමාජිකාවකට නායකත්වය දිය යුතුය.

13 : 03. කිසියම් කණ්ඩායමක නායකත්වය වර්ෂයක කාලයක් වුවත් එම තනතුරේ රැඳීමට හැක්කේ කණ්ඩායමේ කැමැත්ත තිබේ නම් පමණි එසේ නොවුවහොත් වැඩිදෙනාගේ කැමැත්ත මත වෙනත් අයෙකුට එම කණ්ඩායමේ නායකත්වය ලබා ගත හැකිය.

13 : 04. සාමාජික ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමෙන් පසු කණ්ඩායම් නායිකාව විසින් ඒවා ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරික වෙත බාරදිය යුතුය. ඒ සමගම කණ්ඩායමේ පළමු කොටස් වාරික මුදල වූ රු : 50/- ක මුදල ද බාරදිය යුතුය.

13 : 05. භාණ්ඩාගාරික විසින් කොටස් වාරික සඳහා අදාල රිසිට්පත් හා අදාල සටහන් සහිතව පාස් පොත් නිකුත් කළ යුතුයි. ඊට පසුව ග්‍රාමීය කාන්තා සංගමයේ සියළුම ඉල්ලුම් පත්‍ර හා මුදල් බැංකු සංගමයේ මුදල් ලේකම් හෝ පරිපාලන ලේකම් වෙත බාරදිය යුතුය.

13: 06: පරිපාලන ලේකම් විසින් සාමාජික ඉල්ලුම් පත්‍ර පිළිබඳව පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමත කර ගැනීමෙන් පසුව ඒවා සාමාජික ඉල්ලුම් පත්‍ර ලේඛණයට ඇතුළත් කළ යුතුය. සාමාජිකාවන්ට ඔවුන්ගේ සාමාජික අංක දැනුම් දිය යුතුය.

13 : 07. ණය ඉල්ලුම් කිරීමට කණ්ඩායම් නියි පරිදි කොටස් මුදල් ගෙවා තිබීම අත්‍යවශ්‍ය බැවින් කණ්ඩායම් නායකයා ඇතුළු සියළු දෙනාම එම ගෙවීම ගැන සුපරික්ෂාවෙන් සිටිය යුතුය.

13 : 08 පස්දෙනාගේ කණ්ඩායමේ නායකයා විසින් ණය මුදල් ඉල්ලීම පිළිබඳව සුදුසු අය තෝරා ගත යුතුය. මෙහිදී අව්‍යාජත්වය හා ණය මුදල් ආපසු ගෙවීමේ හැකියාව ගැන සැලකිලිමත් විය යුතුය.

13 : 09. ණය මුදල් ඉල්ලුම් කළ යුත්තේ බැංකු සංගමය

විසින් සම්පාදිත අදාල ආකෘති බළ පත්‍ර සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම මගින්ය.

13 : 10. කණ්ඩායම් නායිකාවට ණය ඉල්ලුම් කළ හැක්කේ අනිකුත් සාමාජිකාවන්ට ණය අවශ්‍යතාවයන් සම්පූර්ණ වීමෙන් පසුව පමණි.

13 : 11. ලබා ගන්නා ණය මුදල් ඉල්ලුම් කළ කාර්යයටම වැය කරන්නේද යන්න සොයා බැලීම කණ්ඩායම් විසින්ම කළ යුතුය . ඒ පිළිබඳව සාකච්ඡා කර තත්වය ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති රැස්වීම්වල දී කණ්ඩායම් නායිකාව විසින් ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළ යුතුය.

13 : 12. කිසියම් ණය වාරිකයක් හෝ කොටස් වාරිකයක් කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් ගෙවීම පැහැර හරින්නේ නම්, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීම කණ්ඩායමේ අනිකුත් සාමාජිකාවන් විසින් වහාම කළ යුතුය.

13 : 13. ලබා ගන්නා ලද ණය මුදල් ගෙවීම කණ්ඩාම් සාමාජිකාවක විසින් පැහැර හරින්නේ නම්, අවසානයේ ඒ පිළිබඳ වගකීම කණ්ඩායමේ අනිකුත් සාමාජිකාවන් විසින් බාරගත යුතුව ඇත..

13 : 14. කිසියම් ණය මුදලක් ගෙවීමට කණ්ඩායම් සාමාජිකාවක විසින් පැහැර හරිනු ලැබුවහොත්, අනිකුත් සාමාජිකාවන්ගෙන් ණය මුදල් අයකර ගැනීමට බැංකු සංගමය ක්‍රියා කරනු ඇත. වෙනත් ක්‍රමයක්, නැති වුවහොත් එම හිඟ මුදල් කණ්ඩායම් සාමාජිකාවන්ගේ කොටස් මුදල්වලින් අඩු කරගනු ලැබේ.

13 : 15. ඉහත 13 : 14 යටතේ කණ්ඩායමෙන් අයකරගෙන ද තවදුරටත් ඉතිරි මුදල් ඇත්නම් අදාල ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිය විසින් හිඟ මුදල් ගෙවීමට පියවර ගත යුතුය.

13 : 16. පස්දෙනාගේ කණ්ඩායමට ණය ගැනීමට අවස්ථාව ලැබෙන්නේ ඔවුන් කොටස් වාරික හා ණය වාරික ගෙවීම මගින් බැංකු සංගමය සමඟ ඇති කර ගන්නා විශ්වාසයේ ප්‍රමාණය මතය.

14. අතිරික්තය :-

14 : 01. වාර්ෂික ගණන් පරික්ෂණයකින් පසු අතිරික්තයක් තිබුණහොත් එම අතිරික්තයෙන් 50% ක් ප්‍රාග්ධනය එකතු කරනු ලැබේ.

14 : 02. අතිරික්තයෙන් 25% ක් ආපදා ණය අරමුදලක් සඳහා වෙන් කළ හැකිය. මෙ මගින් සාමාජිකාවන්ගේ ආපදා ණය පහසුකම් වැඩි කිරීමට හැකිවේ.

14 : 03. අතිරික්තයෙන් 10% ක් හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමයට පිරිනැමිය යුතුය.

14 : 04. අතිරික්තයෙන් 5% ක් සේවිකාවන්ගේ දිරි දීමනා සඳහා වෙන්කළ හැකිය.

14 : 05. අතිරික්තයෙන් 10% ක් බල ප්‍රදේශය තුළ පොදු සුභ සාධක කටයුතු සඳහා වැය කිරීමට වෙන් කළ හැකිය.

15 ජන ශක්ති බැංකු සංගම් ව්‍යවස්ථාව:-

15 : 01. මෙම ව්‍යවස්ථාව අදාල බල ප්‍රදේශය තුළ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතිවල එකතුවෙන් පවත්වන මහා සභාවකදී යෝජනා ස්ථිරත්වයෙන් අනුමත කිරීමෙන් හා එසේ පිළිගත් බවට සාමාජිකාවන් අත්සන් කිරීමෙන් පිළිගත් එකක් බවට පත්වේ.

15 : 02. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/2 කට වඩා, රැස්වූ මහ සභාවක 2/3 ක වැඩි ඡන්දයෙන් සම්මත කරගත් යෝජනාවකට හැකිවේ.

15 : 03. ඉහත 15 : 02 යටතේ සංශෝධනයක් කිරීම සඳහා හම්බන්තොට කාන්තා මහ සංගමයේ පූර්ව අනුමැතිය තිබිය යුතුය.

16 ආරවුල් :-

16 : 01. කිසියම් ජන ශක්ති බැංකු සංගමයක හෝ බැංකු සංගම් අතර ආරවුලක් පැන නැගුණහොත්, එය හම්බන්තොට කාන්තා

සංවර්ධන මහ සංගමයටත් උප දිසාපති කාර්යාලයටත් දිසාපති කාර්යාලයටත් දැනුම් දිය යුතුය.

16 : 02. ආරවුල පිළිබඳව අවසාන තීරණයක් හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමය විසින් දෙනු ලැබේ. දිසාපති කාර්යාලයේ හා උප දිසාපති කාර්යාලයේ උපදෙස් කාන්තා සංවර්ධන මහ සංගමයේ කාරක සභාව විසින් අවශ්‍ය පරිදි ලබා ගත යුතුය.

16 : 03. ආරවුල පිළිබඳ තීරණ ගැනීම බැංකු සංගමයේ මහ සභාව විසින් කළ යුතු බවට කාන්තා මහ සංගමය කල්පනා කළහොත් මහ සංගමය විසින් අදාල මහ සභාව කැඳවා තීරණයක් ගනු ලැබේ. එම තීරණය අවසාන තීරණය වේ.

17 පොදු මුද්‍රාව:-

17 : 01. බැංකු සංගමය සඳහා පොදු මුද්‍රාවක් පවත්වාගෙන යා යුතුයි. මෙය පරිපාලන ලේකම් ගේ භාරකාරත්වය යටතේ තිබිය යුතුය.

17 : 02. බැංකු සංගමය වෙනුවෙන් එළඹෙන ගිවිසුම්වල මෙම මුද්‍රා සටහන තැබිය යුතුය. එවැනි අවස්ථාවලදී බැංකු සංගමය වෙනුවෙන් සභාපති හෝ උප සභාපති හා පරිපාලන ලේකම් හෝ මුදල් ලේකම් අත්සන් තැබිය යුතුය.

17 : 03. හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමය මගින් ඒ ඒ බැංකු සංගම් වෙනුවෙන් මෙම මුද්‍රාව සකස් කර දෙනු ලැබේ.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

ජනශක්ති!

ලක්වාසි ජනසවිලාගී කාන්තාවන්
සමග සංවාදයක්
පැවැත්වීමට අපි
බොහෝම ආසාවෙන් සිටිනවා.

අපි එක්වී කතා කරමු
අත්දැකීම් හුවමාරු කර ගමු...

ගරු සභාපතිනිය
දිස්ත්‍රික් කාන්තා සංවර්ධන
මහා සංගමය
දිසාපති කාර්යාලය
හම්බන්තොට

සාගත වසංගත හැම මහ හැරීයන්
මහට ම වගේ යළටත් වැව් පිරීයන්
හැම දියුණුවම පිළිබඳ කිරි තිරීයන්
වන්තිය වෙනස් වුණු ද මා මැරීයන්

*විමලරත්න කුමාරගම 'විවාසිතය'*

මිල රු. 5.00

තරුණ සේවා මුද්‍රණාලය